සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2019

11 ශ්‍රේණිය **සිංහල භාෂාව හා සාහිත්‍යය - I** කාලය පැය 01 යි.

| නම/ විභාග අංකය: |
|---|

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

iii. ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

- **අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.**

01. උත්සවය සඳහා ඔහුගේ පැමිණීම **සීයට සීයක්** ම විශ්වාස කළ නොහැකි ය.

(1) සිය වතාවක් ම (2) දිනපතා ම (3) හැම විට ම (4) සපුරා ම

02. රටක සිදුවන අක්‍රමිකතාවන්ට **උල්පන්දම් දීම** අවස්ථාවාදීන්ගේ සිරිත ය.

(1) යහපත් ප්‍රතිචාර දැක්වීම (2) රහසින් අනුබල දීම
(3) භාණ්ඩ සපයා දීම (4) විරුද්ධ වීම

03. ග්‍රාම නිලධාරී මහතා කළ යෝජනාව **එකපයින්** පිළිගැනීමට ගැමියෝ සූදානම් වූහ.

(1) පය පෙරට තබා (2) සම්පූර්ණ කැමැත්තෙන් (3) යටහත් පහත් ලෙස (4) මඳක් කැමැත්තෙන්

- **අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

04. .................. තොර භාණ්ඩ වෙළඳපොළට එක් වීම පාරිභෝගිකයා නොමඟ යැවීමකි.

(1) ප්‍රමිතියෙන් (2) පරීක්ෂාවෙන් (3) අඩු මිලකින් (4) ප්‍රසිද්ධියකින්

05. කවියාගේ ප්‍රතිභාව වූ කලී අත්දැකීම් යළි යළිත් සිහිකිරීමෙන් නැතහොත් .................. පෝෂණය ලබන්නකි.

(1) අභ්‍යාසයෙන් (2) පරිකල්පනයෙන් (3) ප්‍රාගුණ්‍යයෙන් (4) විචිත්‍රත්වයෙන්

06. වෛද්‍යවරයාගේ සියලු ප්‍රයත්නයන් .................. කරමින් රෝගියා මිය ගියේ ය.

(1) සාර්ථක (2) ව්‍යර්ථ (3) නිරුද්ධ (4) විභේදනය

07. අකාරාදි පිළිවෙළ නිවැරදිව දැක්වෙන පද පේළිය තෝරන්න.

(1) නිරුක්ති, නිදර්ශන, නාමික, නිහීන (2) ඒකමතික, ඒකීය, ගුරුත්වය, කුරිරු
(3) මිහිතලය, මූලාකෘති, මූලිකත්වය, මෝහාදික (4) පිළියන්දල, පාදුක්ක, පෙරළිකාර, පෝරකය

08. සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) පරිශීලනය, ව්‍යංග්‍යාර්ථ, ඓරාවණ, ස්වාභාවික
(2) සාමාර්ථ්‍යය, අභ්‍යවකාශ, සංගායනාව, රිද්මයානුකූල
(3) ජනගහණය, ප්‍රතිචාර, වාර්තාව, පෘෂ්ඨීමත්
(4) අතික්‍රමණය, වීර්‍යය, නැණසර, සාම්ප්‍රදායික

09. එක් එක් පදයේ මුල් අකුරෙහි ඇලපිල්ල, කෙටිපාපිල්ල, රකාරාංශය, දීර්ඝඇදය පිළිවෙළින් ඇති පිළිතුර තෝරන්න.

(1) කැමති, සුවය, වක්‍ර, නැදෑයෝ (2) වාෂ්ප, මූලික, ප්‍රමාණ, සෑය
(3) ධාර්මික, පුෂ්ප, තෘණ, කැමක් (4) මාවත, ගුරුත්වය, ක්‍රමය, මෑත



EXAMRESULTS.LK

10. "දසසිල්" යන පදය අයත් වන්නේ,
(1) දකාරාර්ථ සමාසයට ය. (2) අන්‍යාර්ථ සමාසයට ය. (3) විශේෂණ සමාසයට ය. (4) විභක්ති සමාසයට ය.

11. අනුක්ත නාමපද පමණක් ඇති පද පේළිය තෝරන්න.
(1) තොප, නිළියක්, සතුරෙකු, දැරියක (2) ගංගාවන්, මගීන්, සේවකයකු, ඔවුන්
(3) අපේක්ෂකයෙක්, අප, ක්‍රීඩකයෝ, නාවිකයෙක් (4) සතුන්, මා, බලවතුන්, මොවුහු

12. "සුහදතා" යන්නෙහි "තා" යනු,
(1) විභක්ති ප්‍රත්‍යයකි (2) විශේෂණයකි (3) ප්‍රකෘතියකි (4) තද්ධිත ප්‍රත්‍යයකි

13. පිත්තෙන් ගිලිහී ගිය **පන්දුව** හතරේ සීමාව පසු කළේ ය. මෙහි "පන්දුව" යන පදය අයත් වන්නේ,
(1) කර්ම විභක්තියට ය. (2) කර්තෘ විභක්තියට ය. (3) ප්‍රථමා විභක්තියට ය. (4) අවධි විභක්තියට ය.

- **අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දක්වෙන පිළිතුර තෝරන්න.**

14. නවකතාව වනාහි පුද්ගල ආධ්‍යාත්මය සුබවාදී කරන **යථාර්ථවාදී** කලාවක් බව එම නිර්මාණවලින් පැහැදිලි වේ.
(1) ඇත්ත ප්‍රකාශ කරන (2) යම් සේ පැවසෙන පරිදි
(3) නියම ස්වභාවය ප්‍රකාශ කරන (4) අර්ථය පැහැදිලි කරන

15. ඔවුහු හදිසියේ ම **ඓශ්වර්යයෙන්** යුතු දිවයිනකට ගොඩබැස්සෝ ය.
(1) ඉසුරුමත් බවෙන් යුතු (2) පුදුම උපදවන
(3) භයානක (4) ඉතා අලංකාරවත්

16. පුවත්පත් වාර්තාව **සංක්ෂිප්ත** වීම මෙන් ම, මූලික සිදුවීම විස්තර වීම ද සිදුවිය යුතු ය.
(1) පුළුල් (2) කෙටි (3) අංග සම්පූර්ණ (4) සත්‍ය

17. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.
(1) අසම්භාව්‍ය ක්‍රියා - බැලුවොත්, ගයද්දී, කරත, ගියොත්
(2) කෘදන්ත - බලනා, දුවන, එසවෙන, දිවිලි
(3) තද්ධිත - උදාරතර, වාසනාවන්ත, මුදුනත්, රූමත්
(4) උපසර්ග - අධිවේග, අනුබල, සුරුපී, නුවණැති

18. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමඟ බැඳී නොපවතින පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) රූඪී, පිරුළු, ආප්තෝපදේශ, යුගලපද
(2) අනුප්‍රාසය, එළිවැට, විරිත, උපමා
(3) වරහන, කොමාව, ඇලඉර, තිත
(4) යවන්නාගේ ලිපිනය, මාතෘකාව, ලබන්නාගේ ලිපිනය, දිනය

19. එක් එක් පද පේළිවල දී ඇති පද යුගලවල සමානාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන පද පේළිය තෝරන්න.
(1) සපෙක් - සර්පයෙක්, පීතෘ - පිය, සකල - සියලු, තරිඳු - සඳ
(2) සුරරද - ඉඳුරු, පඬුවන් - විද්වතුන්, නිරුක්ති - අර්ථ, අඹ - ජලය
(3) උතුම් - පවර, සරන - හැසිරෙන, දුල - බබළන, තුමුල - මහත්
(4) සමය - ආගම, මිහි - දෙරණ, වෙසෙස් - වෙනත්, සන්තුෂ්ටිය - සොම්නස

20. මුලින් දී ඇති පදයට සමාන පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) පුවතර - පතළ, පැතිරුණු, දියත, ප්‍රකට (2) නොයෙක් - අනේක, නන්, විවිධ, නෙක
(3) වනය - අරණ, බැද්ද, වල, ප්‍රපාතය (4) ශ්වේත - ධවල, ඇලි, ලෝහිත, හෙළ

21. එම කරුණ **විශද** කිරීමට ඔහු ගත් ප්‍රයත්නය අසාර්ථක විය. මෙහි 'විශද' යන්නට වඩාත් යෝග්‍ය පදය වන්නේ,
(1) විරුද්ධ (2) වෙනස (3) පැහැදිලි (4) එකතු

22. තාත්තා මුදල් <u>**දුන්නොත්**</u> "මට පන්ති <u>**ගොස්**</u> <u>**එද්දී**</u> පොත් රැගෙන ආ හැකියැ" යි නංගී <u>පැවසුවා ය.</u>
ඉහත වාක්‍යයේ ඉරි ඇඳි පදවලට අදාළ ක්‍රියා පද වර්ගය පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා, අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා, පූර්ව ක්‍රියා
(2) අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා, කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා
(3) අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා
(4) කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා

23. වැරදි අදහස දෙන වාක්‍ය තෝරන්න.
    (1) කාලාර්ථය ප්‍රකාශනය පිණිස අසම්භාව්‍ය ක්‍රියාවලදී "ත" ප්‍රත්‍ය භාවිතා කෙරේ.
    (2) මූර්ධජ ළ් සමග සංයෝග වූ "උ" ස්වරය දැක්වීමට "ළු" යෙදේ.
    (3) ව්‍යාකරණයේ දී "සන්ධි" යනුවෙන් හැඳින්වෙනුයේ උච්චාරණය පහසුව සඳහා සිදු වන ශබ්ද ගැළපීමේ ක්‍රමයයි.
    (4) අවසාන ක්‍රියාවට සමගාමීව සිදු කරන ක්‍රියා පූර්ව ක්‍රියා වේ.

24. ගාත්‍රාදේශ සන්ධියට උදාහරණයක් නොවන්නේ මින් කුමක් ද?
    (1) ජීවනෝපාය (2) බුත්සරණ (3) ගිනියම් (4) පන්දහස්

25. දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නිවැරදි ග්‍රන්ථ නාමය තෝරන්න.
    (1) සිකණමව්ළු (2) යගුලතිත් (3) ශේකායව්‍යඛරි (4) දෙදාමුව්වත

- **අංක 26 , 27 යටතේ දී ඇති ප්‍රස්තාවපිරුළට වඩාත් ගැළපෙන අදහස තෝරන්න.**

26. දේසෙ හැටියට බාසෙ කිව්වලු.
    (1) තැනට සරිලන සේ ක්‍රියාව පැවතිය යුතුයි. (2) තමන්ට නිෂ්ඵල දේ අනුන්ට ප්‍රදානය කිරීම.
    (3) අනවබෝධයෙන් යුතුව අනුන් අනුකරණය කිරීම. (4) වාසි පැත්ත ගන්නට කවුරුත් කැමති වෙති.

27. රෝමය ගිනි ගනිද්දී නීරෝ වීණා වාදනය කළා වගේ.
    (1) නොදන්නා දේ කරන්නට ගොස් අමාරුවේ වැටීමකි.
    (2) බරපතළ තත්ත්වයක් තුළ, එය නොතකා සැහැල්ලුවෙන් සිටීම.
    (3) පැවති කරදරයකින් ගැලවෙන්නට කළ දෙයින්, ඊටත් වඩා කරදරයකට පත්වීම.
    (4) පහසු මාර්ග තිබියදීත් වේදනාකාරී මාර්ග ගැනීම.

28. A - මං තනන්නෝ - මහගම සේකර
    B - මයුර සන්දේශය - කවි 164
    C - වාසනාවන්ත සහ කාලකණ්ණි පවුල් - සයිමන් ද සිල්වා
    D - සුන්නද්දූලි - අජිත් තිලකසේන
    A, B, C, D ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ,
    (1) A, B හා C ය. (2) A, C හා D ය. (3) B, C හා D ය. (4) A, B හා D ය.

- **අංක 29 , 30 යටතේ දී ඇති ප්‍රශ්නවලට ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.**

29. (1) අප පැමිණියහ'යි දෙමව්පියෝ සිතා සිටියෝය. (2) අප නීතිගරුක පුරවැසියෝය.
    (3) ගුරුවරු කල් ඇතිව පාසලට පැමිණෙනු ඇත. (4) ඔබයි මමයි ඇයයි රූපවාහිනිය නැරඹූහ.

30. (1) නදී තොමෝ සෙමින් ගලා බසිති. (2) අපි සියල්ලන් ම නේවාසිකයෝ වෙමු.
    (3) ඔවුන් පාසල් නොඑන්නේ ඇයි. (4) ගුරුවරු පැමිණෙද්දී සිසුහු නැගී සිටියෝය.

31. 1. සිසුහු <u>නොහොත්</u> සිසුවියෝ ක්‍රීඩාවල නිරතවෙති.
    2. උදේ <u>සිට</u> වැසි පැවතුන නිසා මාර්ග ජලයෙන් පිරී ගියේය.
    3. නංගී සුරඟනක <u>මෙන්</u> සැරසී තරඟයට පිවිසියාය.
    4. එම කාර්ය සාර්ථක වන්නේ ඔබ <u>ම</u> එහි ගියොත් පමණි.

    ඉහත සඳහන් වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත **නිපාත** පදවල අර්ථය දැක්වෙන අනුපිළිවෙළ කුමක් ද?

    E - සීමාර්ථය නිපාත F - විකල්පාර්ථ නිපාත
    G - සමානාර්ථවාචී නිපාත H - අවධාරණාර්ථය නිපාත

    (1) G, F, E, H (2) H, F, G, E (3) F, E, G, H (4) F, G, E, H

32. පහත දැක්වෙන වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
    "මං ළමයින් එක්ක පිට්ටනියට ගියා."
    (1) මා ළමයි සමග පිට්ටනියට ගියෙමි.
    (2) මම ළමයින් සමග පිට්ටනියට ගියෙමි.
    (3) මා ළමයින් සමග පිට්ටනියට ගියහ.
    (4) ළමයි සමග මම පිට්ටනියට ගියෙමි.

33. "දුකට කියන කවි සීපද" කාගේ නිර්මාණයක් ද?

(1) රැයිපියල් තෙන්නකෝන් (2) ගුණදාස අමරසේකර

(3) පී.බී. අල්විස් පෙරේරා (4) මහගමසේකර

34. උපමාවක් රහිත වරණය තෝරන්න.

(1) අසරණයා වැලපුනත් දාමරිකයා ගේ ගල්හිත උණු නොවී ය.

(2) "මං කිරි ගහට ඇන්නා වාගේ කිව්වේ ඕක තමා" යැයි මව පැවසුවා ය.

(3) සීයා ගේ හිසකෙස් කපුකුල්ලක් බඳු විය.

(4) දැරිය හා පැටවකු මෙන් අහිංසකය.

35. "චිරන්තන සාහිත්යික උක්තීන් භාවිතයට ගන්නා නූතන සාහිත්‍යකරුවා" යන පාඨයෙහි "උක්තීන්" යන වචනයේ අර්ථය කුමක් ද?

(1) කියමන් (2) හසළත්වය (3) අරුත (4) වටිනාකම

36. පහත සඳහන් පද්‍යයෙහි හතරවන පදය තෝරන්න.

"දේසේ සිට ආ එගුරු මහල්ලා
දියට යන්ට ලබු ගෙඩියක් එල්ලා
තඹරාවිට වෙද රාළගෙ බල්ලා
............................................................"

(1) බියෙන් නොහැර ආවයි අත අල්ලා (2) කාපිලු ගුරුවගෙ කකුලම අල්ලා

(3) පුහුන් කරති සක මෙහි පස් අල්ලා (4) එමින් කිරුළු රදහට අත අල්ලා

37. "ඒක නොවෙයි මහාධිකරණතුමනි. ප්‍රශ්නය මේ මවගෙ හදවත ඇතුළත බුර බුරා නගින දුක් ගින්දරයි" මේ සංවාද ඛණ්ඩය ඇතුළත් නාට්‍යය කුමක් ද?

(1) මනමේ (2) සිංහබාහු

(3) හුණුවටය (4) පුංචි අපට දැන් තේරෙයි

38. නුවර කලාවියේ "දියදොස්" ලෙස හඳුන්වන්නේ කුමක් ද?

(1) බිරිඳ ට (2) වැහි කබාය (3) අලුත් හේන (4) පැණි කොමඩු

39. "ඔබ එනතුරා නැත මගෙ හිත සැනසෙන්නේ
මා ගැන නොවෙ ද හිමි මේ හැටි වෙහෙසෙන්නේ
සවසට යාමටයි ඔබ උදයට එන්නේ
මෙහෙමද ජීවිතේ දිගට ම ගත වෙන්නේ"

මෙම පද්‍යයේ පන්තියේ නම කුමක් ද?

(1) හැංගිමුත්තං (2) ධීවරී ගීතය (3) සිනා කුමරි (4) වස්සානේ

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන වරණය තෝරන්න.

"තම ජන්ම භූමියේ ස්වභාව සෞන්දර්යය, ඓතිහාසික උරුමය, ජාතික නිදහස ගැන කියවෙන දේශානුරාගය දැනවෙන නිර්මාණ කළ ලේඛකයෝ බොහෝ ය. එම නිර්මාණයන් ගේ මුඛ්‍යාර්ථය වූයේ රටවැසියන් තුළ දේශාභිමානය ජනනය කිරීම ය.

(1) තම ඉපදුන රටෙහි උරුමයන් ගැන නිර්මාණ ඉදිරිපත් කළ ලේඛකයෝ බොහෝ වෙති. රටවැසියන් තුළ දේශාභිමානය ඇති කිරීම එම නිර්මාණවල ප්‍රධාන අරමුණයි.

(2) තම රට පිළිබඳවත් එහි විවිධ උරුමයන් ගැනත් ලේඛකයෝ ලියන්නට කැමති වූහ. ඒ තුළින් රටවැසියා තුළ දේශාභිමානය ඇති විය.

(3) රටවැසියා තුළ දේශාභිමානය ජනනය කිරීමට ලේඛකයා උත්සහ කළේ ය. ඒ සඳහා ඔහු කාව්‍ය නිර්මාණ පාදක කර ගනී.

(4) තම ඉපදුන රට ගැන කියවෙන දේශානුරාගය දනවන නිර්මාණ කළ නිර්මාණකරුවන් බොහෝ වුව ද ඒවායේ මූලික අරමුණ වූයේ රටවැසියන් තුළ අභිමානය ඇතිකිරීමයි.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2019

11 ශ්‍රේණිය **සිංහල භාෂාව හා සාහිත්‍යය - II** කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු 80 කි.

---

- **අංක (i) සිට (x) දක්වා ඇති සියලු ම ප්‍රශ්න සඳහා කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(01) (i) සිංහල අක්ෂර මාලාවේ ඇතුළත් පහත සඳහන් වන අක්ෂර දෙක බැගින් ලියා දක්වන්න.

(අ) සංයුක්ත අක්ෂර (ආ) ඕෂ්ඨජාක්ෂර

(ii) පහත වචනවල අර්ථය නිරූපණය වන සේ ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය දෙකක් නිර්මාණය කරන්න.

(අ) දරන (ආ) දරණ

(iii) දී ඇති පහත පද නිවැරදි කරන්න.

(අ) ප්‍රභාමත් (ආ) අවස්ථාවෝචිත

(iv) පහත පද්‍ය පාදවල ඉරි ඇඳි පද නිවැරදිව විසන්ධි කොට සන්ධි නාමය ලියන්න.

තුඟුතර ගිරි පළන දළ <u>දළුගින්</u> පැහැර
මත <u>වරණිඳු</u> ට පෙදෙනැන වෙහෙසන අයුර

(v) පහත පදවල ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන්කර ලියන්න.

(අ) ආගමික (ආ) නෛපුණ්‍යය

(vi) පහත උද්ධෘතයේ තද කළු අකුරින් මුද්‍රිත පද අයත් ව්‍යාකරණ ප්‍රවර්ගය ලියා දක්වන්න.

මෛත්‍රේය හිමියන්ගේ මහා **<u>පාණ්ඩිත්‍යය,</u>** ප්‍රඥා බලමහිමය **<u>අබිමුව</u>** උගතුන්යැයි කියා ගන්නා බොහෝදෙනා හිරු දුටු කදෝපැණියන් මෙනි.

(vii) විරුද්ධාර්ථ පද ලියන්න.

(අ) ප්‍රතිචීන (ආ) නෂ්ට

(viii) පහත කර්තෘකාරක වාක්‍ය නිවැරදි ව කර්ම කාරක බවට හරවන්න.

(අ) නිර්මාණකරුවා තමා ලත් සැබෑ අත්දැකීම් කෙටිකතාකරණයට යොදා ගනියි.

(ආ) පැරණි රජවරු පසුකාලීන ප්‍රයෝජනය සඳහා බොහෝ වැව් ඉදි කළහ.

(ix) ගැළපෙන ලෙස පළමු පදය හෝ දෙවන පදය වෙනස් කර ලියන්න.

(අ) මේබලා දම (ආ) විදුහල් පරිශ්‍රය

(x) සාමාන්‍ය ව්‍යවහාරයේ භාවිත වන පහත යෙදුම් සඳහා පතල් කර්මාන්තයේ යෙදෙන වචන ලියා දක්වන්න.

(අ) කැට ගල් සහිත පස් තට්ටුව

(ආ) ගැරීමෙන් පසු පතුලේ ඉතිරිවන කොටස (ලකුණු 2 x 10 = 20)

02 පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) දිනපතා ලෝකයේ නිරායුධ මිනිසුන් සිය ගණනකගේ දිවි අහිමි වන්නේ ඔවුන්ගේ වරදකින් නම් නොවේ. සුළුතරයක් තම ආගමික ජාතිවාදී මතවාදයන් කෲරත්වය හා ප්‍රචණ්ඩත්වය තුළින් ව්‍යාප්ත කිරීමට ගන්නා උත්සාහයේ දී එහි ශෝචනීය ගොදුරු බවට පත්වන්නේ යට කී අහිංසක නිරායුධ මිනිසුන් ය. සෑම ආගමකින් ම උගන්වන්නේ සහජීවනය, සමානාත්මතාවය හා අවිහිංසාවාදය නම් මෙවන් අමානුෂික ක්‍රියාවන්හි අවශ්‍යතාව කුමකට ද? මෙවන් ක්‍රියාවන්හි අවසාන ප්‍රතිඵලය බියකරුය. මේවාට එරෙහි ව නැගී සිටීම තවත් ප්‍රමාද කළ යුතු ද?

(ආ) සමස්ත තුන්වන ලෝකය ම වෙළා ගත් දිළිඳු බව අප රටට ද පොදු ගැටලුවකි. ආදායම් සමාන ව බෙදී නොයාම මෙන් ම ලැබෙන ආදායම නිසි ලෙස කළමනාකරණය කර නො ගැනීම ද මෙම තත්ත්වයට බලපාන හේතු අතර වේ. නිදහසින් පසු හඳුන්වා දුන් නොයෙක් දිළිඳු සහන වැඩසටහන්වල අරමුණ වූයේ ඔවුන් දිළිඳු බවින් මුදවා ස්වෝත්සාහී ව නැගී සිටීමට සවිබල ගැන්වීම යි. එහෙත් සිදු වූයේ දිගින් දිගට ම ඔවුන් සහනාධාර මත යැපෙන්නට උත්සාහ දැරීමයි. මේ නිසා දිළිඳු සහන වැඩසටහන් ඵලදායී ව සැලසුම් කිරීම අවශ්‍ය ය.

(ඉ) එකිනෙකා පසු බා යමින් අනවරත ජීවන තරගයක යෙදෙන මිනිසාට කොතෙක් හඬ ගා කීව ද නො ඇසෙන එකම වදන "පාරිසරික සුරක්ෂිතතාවය" යි. පරිසරයට ඔහු අතින් ම සිදු වූ හානි නිසා ඔහුට ම විඳින්නට සිදු වූ කරදර අපමණ වුව ද ඒවා මොහොතින් අමතක ව යාම කෙතරම් කනගාටුදායක ද? යළිත් පෙර ලෙස ම පරිසරය අනිසි ලෙස භුක්ති විඳින්නේ ඊළඟ විපතේ බැරෑරුම්කම පිළිබඳව ද නොසිතා ය. මෙය රටේ අභාග්‍යයකි. වාතය, ජලය මෙන් ම පස ද දූෂ්‍ය කරන මිනිසා තිරසාර සංවර්ධනයට කෙසේ ළඟා වේද?

(ඊ) එදා හදවත් තුළ කරුණාව, දයාව, ආදරය ආදී මිනිස් ගුණ දම් රෝපණය කළ ආධ්‍යාත්මය සැනසූ ගීතයට ලැබුණේ අභිමානවත් තැනකි. එදා පද රචකයෝ හා ගායක ගායිකාවෝ ශ්‍රාවක හදවත් තුළ අමරණීය චරිත බවට පත් වූහ. එහෙත් අද ගීතය එයට හාත්පසින් ම වෙනස් වූවකි. එය හැඟීම් කුපිත කරවන සුලු, හුදු තාවකාලික වින්දනයක් පමණක් ලබාදෙන ආවේගශීලී කලාවකි. මෙය ගීතයේ සංවර්ධනාත්මක ගමන්මග නොවේ. අතීතයේ ගීතයෙන් ඉටු වූ සමාජ මෙහෙවර තවදුරටත් ඉටුවීම අත්‍යවශ්‍ය ය. (ලකුණු 25)

03 පහත ඡේද වචන 45 - 55 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ ලියූ සාරාංශයෙහි ඇතුළත් වචන සංඛ්‍යාව පිළිතුර අග ලියා දක්වන්න.

අර්ථ රසය ඇති කිරීමෙහි ලා ලේඛකයාට භාෂාව වැදගත් වේ. පද්‍ය රචනයේ දී උපයෝගී කර ගන්නා වචන ප්‍රමාණය අල්ප ය. පුළුල් අදහසක් ප්‍රකාශ කිරීමට එහිදී යොදා ගන්නේ සීමිත වචන ගණනකි. කවි බස කුමක් විය යුතුදැයි ස්ථිරව ම නිගමනය කළ නොහැක. තම නිර්මාණයෙන් රචකයා, පාඨකයා තුළ යම් රසයක් දැනවීමට අදහස් කරයි ද එය ඉටුවන පරිදි එහි බස සකස් විය යුතු ය. කාව්‍යයෙහි උසස් බව රැක ගැනීමෙහි ලා බස ඉතා වැදගත් තැනක් ගනියි.

නිර්මාණයක් කිරීමෙහි දී එය විසිතුරු කිරීම සඳහා උපමා, රූපක, රූඪී, පිරුළු ආදී කාව්‍යාලංකාර යොදා ගනු ලැබේ. රචනයක් කියවීමේ දී හෝ ලේඛනයක් කියවනු අසා සිටීමේ දී හෝ අප තුළ විචිත්‍රත්වයක් ඇති වන්නේ ලේඛකයා යොදා ගන්නා මෙබඳු භාෂා ප්‍රයෝග නිසා ය. සාහිත්‍ය රස උද්දීපනයේ දී රචනා ශෛලිය ද වැදගත් වේ. ශෛලිය ලේඛකයාගෙන් ලේඛකයාට වෙනස් වේ. සමහරු දිගවැකි ලියති. සමහරු කෙටි වැකි ලියති. ඇතැමෙක් දිගවැකි හා කෙටි වැකි ලියති. මිශ්‍ර ව ලියති. රචකයෙකුගේ මේ පෞද්ගලික රචනා රටාව ශෛලිය නමින් හැඳින්වේ. කවියා තුළ පහළ වූ සිතුවිලි ඒ වූ පරිද්දෙන් ම වටහා ගැනීමට පාඨකයා සමත් වන්නේ නම් ඒ සාර්ථක රචනයකි. සාරවත් රචනය විසිතුරු චිත්‍රයක් මෙන් සිත් ඇද ගන්නා සුලු ය. සාහිත්‍යයෙහි චිත්ත රූප මැවීම යනුවෙන් හැඳින්වෙන්නේ මේ ලක්ෂණය යි.

සාහිත්‍යය කලාවකි. සාර්ථක වූත් විශිෂ්ට වූත් කලා නිර්මාණයක ඇති රසය කාලය, දේශය ජාතිය හෝ ආගම් ආදිය අනුව වෙනස් නොවේ. උසස් කලා කෘතියක් ලෙස හැඳින්විය හැකි සාහිත්‍යය නිර්මාණය ද මුළු මානව සංහතියට ම එක සේ රස විඳිය හැක්කක් විය යුතුය. විශ්ව සාහිත්‍යයේ කොටසක් බවට පත් වන්නේ ද එබඳු නිර්මාණයි. (ලකුණු 10)

04 පහත ඡේදය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

කතුවැකියට නොදෙවෙනි අසහාය බලයක් තීරු ලිපිවල ද දක්නට ලැබේ. කතුවැකි මෙන් තීරු ලිපි ද ආරම්භ වන්නේ, ප්‍රස්තුත මාතෘකාව ගැන කෙරෙන විශ්ලේෂණාත්මක විස්තරයකිනි. අනතුරුව විවිධ දෘෂ්ටි කෝණ ඔස්සේ රසවත් ව හා බුද්ධි ගෝචර ව ගැඹුරින් කරුණු ඉදිරිපත් කෙරේ. තීරු ලිපියෙහි සමාප්තිය යටතේ ලේඛකයා විසින් අපේක්ෂිත පණිවුඩය පාඨකයා වෙත ප්‍රදානය කෙරේ.

තීරු ලිපිය මගින් බොහෝ විට නිරූපණය වන්නේ හාස්‍ය හා උපහාසයයි. ද්වේෂ සහගත දෘෂ්ටියකට වඩා සානුකම්පිත දෘෂ්ටියකින් කරුණු පැහැදිලි කිරීම තීරු ලිපියේ ස්වභාවයයි. උපදේශාත්මක ලක්ෂණ ද තීරු ලිපියක අන්තර්ගත වේ. සමකාලීන ප්‍රශ්න විවිධාකාරයෙන් නිරූපණය කිරීමේ දී රචකයාගේ රුචි අරුචිකම් අනුව ද තීරු ලිපිවල සන්දර්භය වෙනස් විය හැකිය. සමාන සිදුවීමක් ගැන පවා තීරු ලිපි රචකයන් දෙදෙනෙකු අතින් බිහි වන්නේ දෙයාකාර නිර්මාණයි.

මේ ලිපි දෙවර්ගයෙහි ම යොදා ගැනෙන්නේ සමකාලීන සරල බස් වහරයි. වාක්කෝෂය හා භාෂා භාවිතය පිළිබඳ හසල දැනුම මේ දෙවර්ගයට ම අයත් රචනා නිර්මාණයෙහි යෙදෙන ලේඛකයන් සඳහා ප්‍රයෝජනවත් වේ. උපමා රූපක හා ප්‍රස්තාව පිරුළු වැනි යෙදුම් ද මෙහි දී භාවිත කෙරේ. කතුවැකි භාෂා ශෛලිය ඇතැම් විට සංකීර්ණ ස්වභාවයක් ගනී. සාහිත්‍ය ව්‍යවහාරයේ පවත්නා මිශ්‍ර සිංහල යෙදුම් ද මෙහි දී යොදා ගැනේ. එහෙත් තීරු ලිපියෙහි දී ඉතා ළගන්නා ආකාරයෙන් කටවහර ඉදිරිපත් කෙරේ. ශබ්ද කෝෂ හෝ ගැටපද විවරණ පෙරළා බලා අරුත් වටහා ගතයුතු දුරවබෝධ යෙදුම් තීරු ලිපිවල දක්නට නොමැති තරම් ය. තීරු ලිපි පොදු පාඨකයා අතර ජනප්‍රිය වීමට මේ සරල භාෂා ව්‍යවහාරය ද හේතුවන්නට ඇත.

(i) ඡේදයෙන් කියවෙන ලිපි දෙවර්ගය සඳහන් කරන්න.

(ii) ලිපිවල සන්දර්භය වෙනස් විය හැකි අවස්ථාවක් සඳහන් කරන්න.

(iii) තීරු ලිපියෙහි සමාප්තියේ දී ලේඛකයාගේ කාර්යභාරය කුමක් ද?

(iv) ලිපි දෙවර්ගයෙහි ම ලේඛකයන් උදෙසා ප්‍රයෝජනවත් වන මෙහි සඳහන් වන කුසලතා මොනවා ද?

(v) තීරු ලිපිවල ජනප්‍රියතාවට හේතුවක් ලෙස මෙහි දක්වා ඇත්තේ කුමක් ද? (ල. 10)

05. මිහිමල්යාය එක්සත් ගොවි සංගමයේ කාරක සභා රැස්වීම පසුගිය දා පැවැත්විණි. එහිදී කරන ලද සාකච්ඡාවේ කොටසක් පහත දැක්වේ.

- අපි ගොවීන් දිරිගන්වන විදියේ වැඩසටහනක් කරන්න ඕනෑ.

- ඔව්, ඔව්. හැමෝම ගොවිතැන ගැන කලකිරිලා ඉන්නෙ.

- අපි ගොවි සංගමයේ හැමෝම ඇතුළත්වෙන විදියට වගා තරගයක් සංවිධානය කරමු. "හරිත පෙරළිය" කියලා නමකුත් දමමු.

- ඒක හොඳයි, දැං වැහි කෝඩෙත් අල්ලගෙන එන හින්දා වතුරෙන් හිගයක් වෙන්නෙත් නෑ.

- හැබැයි මේක වස විස නැති වගාවක් වෙන්න ඕනෑ. ඒක අනිවාර්ය කරන්න මහත්තයෝ.

- අපි මේක කොහොමද සංවිධානය කරන්නෙ?

- මාස 06 කට කාලය සීමා කරමු. පළමුවැනි මාසය අවසානයේ ඉඳලා වගාව පරීක්ෂා කරලා ලකුණු දෙන්න පුළුවන්.

- මේවයි වචන්නෙ කියලා විශේෂයක් නැහැ. අවශ්‍ය කරන බීජ වර්ග හා උපදෙස් රජයෙන් ලබා දෙන්න කටයුතු කරන්න පුළුවන්.

- එතකොට වගාවට සමගාමීව කාබනික පොහොර නිෂ්පාදනයක් වෙනවා නම් ඒකට විශේෂත්වයක් ලබා දෙමු.

- තෑගි කොහොමද?

- අපට අනුග්‍රාහකයෝ හොයා ගන්න පුළුවන් නිසා සහභාගි වන හැමෝට ම කෘෂි උපකරණ කට්ටලයක් දෙමු. පළමුවැනි ස්ථානයට රු. 25000/=, දෙවැනි ස්ථානයට රු. 20000/= තෙවැනි ස්ථානය රු. 15000/=.

- එහෙම හොඳයි. එහෙනම් ලේකම්තුමා මේ ගැන අපේ ගොවි සංවිධානෙ කට්ටිය දැනුවත් කරන්න හොඳ දැන්වීමක් සකස් කරල ගමේ කීප තැනක ම අලවන්න. විස්තර දැනගන්න කෘෂි පර්යේෂණ නිලධාරී තුමාගේ දුරකථන අංකයන් දාන්න.

ඉහත සංවාදය ඇසුරු කරගෙන වචන 150 ට නො අඩු දැන්වීමක් සකස් කරන්න.

**නැතහොත්**

බණ්ඩාරවෙල, සුබෝධගම මහා විද්‍යාලය සිසුන් 700 ක් පමණ ඉගෙනුම ලබන පාසලකි. මෙහි සිසුහු බොහොමයක් අයහපත් පවුල් පරිසරයන්ගෙන් පාසලට පැමිණෙන්නෝය. ඔවුන්ට ආදරය, රැකවරණය මෙන් ම පෝෂණය ද පවුල තුළින් හොඳින් නො ලැබේ. මෙයට ප්‍රධාන හේතුව පියවරුන්ගේ බීමත්කමයි. දරුවන් සම්බන්ධ දෙමාපියන්ගේ වගකීම් හා යුතුකම්වල නීතිමයකරුණු පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීමක් කළ යුතුව ඇත. මේ සඳහා සුදුසු නිලධාරී මහතෙකු හෝ මහත්මියක 2019.11.30 දින ප.ව. 1.00 ට විද්‍යාලයේ ප්‍රධාන ශාලාවේ දී පැවැත්වෙන පාසල් සංවර්ධන සමිතියේ මහ සභා රැස්වීම සඳහා සහභාගි කරවන මෙන් ඉල්ලා බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් තුමා වෙත යවන ලිපිය සකස් කරන්න. එම විදුහලේ විදුහල්පති නිමල් සකලසූරිය ඔබ යැයි සිතන්න. ඔබේ ලිපියේ වචන 150 ක් පමණ තිබීම ප්‍රමාණවත් වේ. (ල. 15)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2019

11 ශ්‍රේණිය **සිංහල භාෂාව හා සාහිත්‍යය - III** කාලය පැය 02 යි.

නම/ විභාග අංකය:

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් ප්‍රශ්න එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 80 කි.

(01) (i) සිට (x) තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) ''පණ්ඩිතයෙනි, තොපට සුදුසු පඬුරක් සොයන්නෙමි.''
(අ) ඉහත ප්‍රකාශය සිදු කරනු ලබන්නේ කා විසින් ද?
(ආ) මෙහි සඳහන් පඬුර කුමක් ද?

(ii) ''දෑසේ කඳුළැලි පිස දා බලනෙමි
හෙට හිරු එළියට වඩින දිනේ''
(අ) ඉහත පද්‍ය පාඨ අන්තර්ගත කාව්‍ය සංග්‍රහය කුමක් ද?
(ආ) එම කාව්‍ය සංග්‍රහයට අමතරව එම රචකයා විසින් රචනාකළ වෙනත් කාව්‍ය කෘතියක් නම් කරන්න.

(iii) පැරණි ම සිංහල සන්දේශ දෙක නම් කරන්න.

(iv) ''ඔකෙන් මට මොකක් කරන්නෙයි කියලාද කියන්නේ?''
(අ) ඉහත ප්‍රකාශය කරනු ලබන්නේ කවුරුන් ද?
(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් කෙටි කතාව කුමක් ද?

(v) (අ) සම්භාව්‍ය සාහිත්‍ය ගණයට අයත් කෘති අතුරින් අවසන් පුරුක ලෙස සැලකෙන සිවුපද කාව්‍ය කෘතිය කුමක් ද?
(ආ) එම කෘතියේ රචකයා නම් කරන්න.

(vi) වැහි වලාකුළු රංචු කඳු මුදුන්වල ලගින
දූන් ඒවි තැනි බිමට - සීතලයි මගෙ සිතට
..........................................................................
..........................................................................
ඉහත පද්‍යයේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

(vii) ''නෑ ආයුබෝවන්, මේ දවස් ටිකේ එක දිගට ම කුඹුරු වැඩ තිබුණ. ඒකයි ඉවර කර ගන්න බැරි වුණේ.''
(අ) ඉහත ප්‍රකාශය කරනු ලබන්නේ කවුරුන් විසින් ද?
(ආ) මෙසේ පවසන්නේ කා හටද?

(viii) (අ) මහගමසේකරයන් රචනා කළ පර්යේෂණ ග්‍රන්ථය කුමක් ද?
(ආ) මහගමසේකරයන්ගේ සිනමාවක් බවට පත් වූ නවකතාව කුමක් ද?

(ix) (අ) බිය නොවන් අය්‍යණ්ඩි කාව්‍ය සංග්‍රහයේ රචකයා නම් කරන්න.
(ආ) කේ. ජයතිලකයන්ගේ මුල්ම කෙටිකතා සංග්‍රහය කුමක් ද?

(x) පහත සඳහන් රජවරු විසූ යුගය නම් කරන්න.
(අ) දෙවන පරාක්‍රමබාහු
(ආ) සවන පරාක්‍රමබාහු (ලකුණු 2 x 10 = 20)

02 පහත සඳහන් ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) සන්නත් සිහින් ගෙදි සෙවණලු <u>වැලිතෙලෙන</u>
තැන් තැන් වලම සැත පී සියුමැලි බැවින
රන්වන් කරල් ගෙනැ එන ගිරවුන් අතින
යන් <u>මන්නොසින්</u> මඟ තොරතුරු නියමඳන

(අ) තදකළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) සමස්ත කවියෙහි අර්ථය ලියන්න.

(ii) ''ඔව් එදා ඔයාව හම්බ වෙලා කථා බස් කරලා ගිය දවසෙ ඉදන් අද වන තුරු මම වින්ද කරදර හිරිහැර අනන්තයි. අප්‍රමාණයි....''

(අ) මෙපරිද්දෙන් කථා බහේ යෙදුණු අය කවුරුන් ද?

(ආ) මෙම ප්‍රකාශය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iii) ''කෙළි ළළුවෙහි ඇලුම් තබා ලා ගිය දවස පැවැති පස් කඳෙහි ආලයත් හරුව. එම පස් කඳ එන දවස පවත්නා ඇලුමුත් හරුව.''

(අ) මෙම ප්‍රකාශය පවසන ලද්දේ කවුරුන් විසින් කා හටද?

(ආ) සමස්ත පාඨයේ අර්ථය ලිහිල් බසින් ලියන්න.

(iv) නොදනිති හසරක් නුපුරුදු එ තිදෙන
පැමිණෙන පිරිපත වළකනු කෙලෙසද

(අ) මෙසේ පවසන අය කවුරුන් ද?

(ආ) මෙහි සඳහන් තිදෙන කවුරුන් ද?

(v) **මිහ'ඹ** මුව මඬල මෙන් දිලෙන හැම විට
දුලබ ඉසුරු පිරි සැදි ඒ වෙහෙර සිට
**කිරඹ** පොකුර මී රස ලැබ බොන ලෙසට
නරඹ මිතුර තගෙ නෙත සිත සතුටු කොට

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අරුත් ලියන්න.

(ආ) නෙතසිත සතුටු කරමින් නරඹන්න යැයි පවසන්නේ කුමක් ද? ඒ කා හටද?

(ලකුණු 4 x 5 = 20)

03 (i) අපට වැසිකිළියක් නිර්මාණයේ අත්දැකීමට ගැළපෙන ආකාරයට සංවාද ගොඩනැගීම හා අවස්ථා නිරූපණය තුළින් කතාවේ රසවත් බව තීව්‍ර කර ඇති ආකාරයත්,

(ii) වැසිකිළි පාවිච්චි නොකර සාම්ප්‍රදායික ඇබ්බැහිකම්වලට පුරුදු වූ ගැමියා ඉන්මිදී වැසිකිළි භාවිතයට අනුගත වූ අයුරුත්, එක් කොටසකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

<u>නැතහොත්</u>

(i) දැතේ කරගැට පද්‍ය පන්තියෙන් අනාගතයේ උපදින දරුවන්ට ලෝකය ඉදිකර දීම සඳහා ගත වෙහෙසා කටයුතු කිරීම සුදුසු බවත්,

(ii) පද්‍ය පන්තිය රසවත් කර ගැනීම සඳහා කවියා යොදා ගෙන ඇති ධ්වනිතාර්ථ, රූපකාර්ථ, සංකේත වැනි රචනා උපක්‍රමත්, පද්‍ය පන්තිය ඇසුරින් උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.
(ලකුණු 15 යි.)

04 (i) දියමන්ති මාලය කෙටිකතාවේ මැටිල්ඩා සිය රූ සපුව නිසා ඉහළ සමාජයේ ඇවතුම් පැවතුම් අනුකරණයට කැමැත්තක් දක්වූ අයුරුත්,

(ii) සිය අහිංසක සැමියාද විපතේ හෙළමින් දුර්භාග්‍ය ළඟා කර ගන්නා අයුරුත්, කතාවේ සිද්ධි හා අවස්ථා මගින් රසිකයාට සමීප කරවා දෙයි. එක් කොටසකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

<u>නැතහොත්</u>

(i) අමාවතුර ග්‍රන්ථයේ භාවිත භාෂා ශෛලියත්,

(ii) අවස්ථා නිරූපණයත්,

අපූර්ව ආකාරයට ඉදිරිපත් කරන්නට ගුරුළුගෝමී පඬිතුමා සමත් වී ඇත. නිර්දිෂ්ට පාඩම ඇසුරින් එක් කොටසකට නිදසුන් දෙක බැගින් දක්වමින් විමසන්න. (ලකුණු 15 යි.)

- **අංක 05, 06, 07 ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.**

05 ජය ඝෝෂාව ලොවෙහි ව්‍යාප්ත කරමින් ගුත්තිල ඇඳුරුතුමා පැවැත් වූ වීණා නාදයේ මිහිරියාවෙන් අවට රැස් වූවන් වශී වූ ආකාරය උදාහරණ තුනක් දෙමින් පහදන්න.

06 කේවට්ට බමුණා නිසා චූලනී බ්‍රහ්මදත්ත රජතුමාගේ සේනාව දැඩි පීඩාවට ලක් වූ අයුරු උමංදාවේ ධර්ම යුද්ධ කතා පුවතෙන් උදාහරණ තුනක් දෙමින් පැහැදිලි කරන්න.

07 වස්සානය පද්‍ය පන්තියේ වස්සානය නිසා පිබිදෙන පරිසරයේ සුන්දරත්වය අපූර්වත්වයෙන් ඉදිරිපත් කර ඇති ආකාරය නිදසුන් තුනක් දක්වමින් පැහැදිලි කරන්න. (ල. 10 යි)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **තෙවන වාර පරීක්ෂණය 2019**

**11 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - (4) | 11 - (2) | 21 - (3) | 31 - (3) |
| 2 - (2) | 12 - (4) | 22 - (3) | 32 - (2) |
| 3 - (2) | 13 - (3) | 23 - (4) | 33 - (4) |
| 4 - (1) | 14 - (3) | 24 - (1) | 34 - (1) |
| 5 - (2) | 15 - (1) | 25 - (2) | 35 - (1) |
| 6 - (2) | 16 - (2) | 26 - (1) | 36 - (2) |
| 7 - (3) | 17 - (4) | 27 - (2) | 37 - (3) |
| 8 - (1) | 18 - (2) | 28 - (4) | 38 - (4) |
| 9 - (4) | 19 - (4) | 29 - (1) | 39 - (2) |
| 10 - (3) | 20 - (2) | 30 - (3) | 40 - (1) |

## II කොටස

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

01 (i) (අ) ඓ, ඖ (ආ) ප, ඵ, බ, භ, ම

(ii) (අ) සාහිත්‍ය සමිතියේ සභාපති ධූරය දරන නිමල් අද පැමිණ නැත.
(ආ) නාගයා මිදුලේ දරණ ගසා ගෙන අවව් තපිමින් සිටියේ ය.

(iii) (අ) ප්‍රභාවත් (ආ) අවස්ථෝචිත

(iv) (අ) දළ + අගින් - පරස්වර ලෝප සන්ධිය (ආ) වරණ + ඉඳු - පූර්ව ස්වර ලෝප සන්ධිය

(v) (අ) ආගම් + ඉක (ආ) නිපුණ + ය

(vi) (අ) පාණ්ඩිත්‍යය - තද්ධිත (ආ) අබිමුව - උපසර්ග

(vii) (අ) ප්‍රතිචීන - ප්‍රාචීන (ආ) නෂ්ට - අවිනෂ්ට

(viii) (අ) නිර්මාණකරුවා විසින් තමා ලත් සැබෑ අත්දැකීම් කෙටිකතාකරණයට යොදා ගනු ලබයි.
(ආ) පැරණි රජවරුන් විසින් පසුකාලීන ප්‍රයෝජනය සඳහා බොහෝ වැව් ඉදිකෙරිණ/ඉදිකරනු ලැබිණි.

(ix) (අ) මෙවුල් දම / මේඛලාදාමය (ආ) විදුහල්පෙදෙස / විද්‍යාල පරිශ්‍රය/විද්‍යාල ප්‍රදේශය

(x) (අ) ඉල්ලම (ආ) නාම්බුව (ලකුණු 2 x 10 = 20)

02 (අ) වාර්ගික, ආගමික සමජීවනයෙන් රටක් දියුණුවට පත්වන ආකාරය.
අහිංසක මිනිසුන්ගේ හා දරුවන්ගේ ජීවිත බිලි වේ.
මෙම සටන් නිෂ්ඵල ය.
සෑම ආගමක් ම සහජීවනය උගන්වයි.
මේවායින් අත්මිදීමට යෝජනා

(ආ) දිළිඳුභාවයට හේතුවන කරුණු
මෙතෙක් හඳුන්වා දී ඇති දිළිඳු සහන වැඩසටහන්වල අරමුණු
නොලැබෙන විට උද්ඝෝෂණවල නියැලීම
ස්වයං රැකියාවල නියැලීමට ඇති අකමැත්ත

(ඉ) ඇතැම් දැනුවත් කරන්නන් තුළ පවා පරිසරය සුරැකීමේ අරමුණ නොමැත
ස්වාභාවික ආපදා මිනිසා නිසා සිදු වේ.
මෙම ආපදා සඳහා ඇති බිය කෙටි කලකින් අමතක ව යන බව
පරිසරය අපිරිසිදු වන ක්‍රම
2030 තිරසාර සංවර්ධනය සිහිනයක් විය හැකිය

(ඊ) ගීතය හදවත් නිවන කලාවකි
එදා ගීතය අර්ථවත් හා ලයාන්විත විය
අද මිනිස් හදවත් ව්‍යාකූල කරන්නට ගීතය උදවු ලබා දෙයි.
ගීතයේ මෙහෙවර අර්ථවත් කළ යුතුය.

ලකුණු විග්‍රහය :-

| | | |
|---|---|---|
| සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළුව | - | ලකුණු 08 |
| සංවිධානය, නිර්මාණාත්මක බව, ස්වීයත්වය | - | ලකුණු 12 |
| ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදීම | - | ලකුණු 05 |
| | | මුළු ලකුණු 25 යි. |

03 අන්තර්ගතය

1. යොදා ගන්නා බස කුමක් වුවත් කාව්‍ය යේ උසස් බවට එය ඉතා වැදගත් වේ.
2. කාව්‍යාලංකාර නිසා පාඨකයා හෝ ශ්‍රාවකයා තුළ විචිත්‍රත්වයක් ඇති වේ.
3. රස ජනනයේ දී වැදගත් වන රචනා ශෛලිය ලේඛකයාගෙන් ලේඛකයාට වෙනස් වේ.
4. සාර්ථක රචනයක චිත්ත රූප මැවීමේ හැකියාව ඇත.

5. විශිෂ්ට කලා නිර්මාණයක රසය කිසිදු භේදයකට වෙනස් කළ නොහැක.
6. සැමට එක සේ රස විඳිය හැකි නිර්මාණ ලෝක සාහිත්‍යය හා එක් වේ.

ලකුණු විග්‍රහය :-

| | |
|---|---|
| අන්තර්ගතය | ලකුණු 06 යි. |
| වචන ගණන | ලකුණු 02 යි. |
| ශිල්ප දක්ෂතා | ලකුණු 2 යි. |
| | මුළු ලකුණු 10 යි. |

04 (i) කතුවැකි හා තීරු ලිපි
(ii) රචකයාගේ රුචි අරුචිකම් අනුව
(iii) අපේක්ෂිත පණිවුඩය පාඨකයා වෙත ප්‍රදානය කිරීම
(iv) වාක් කෝෂය හා භාෂා භාවිතය පිළිබඳ දැනුම
(v) සරල භාෂා ව්‍යවහාරය

ලකුණු විග්‍රහය :- එක් නිවැරදි කොටසකට ලකුණු දෙක බැගින් (ලකුණු 2 x 5 = 10)

05 අන්තර්ගතය :-
1. 'හරිත පෙරළිය' වගා තරගය
2. වසවිස නැති වගාවක් විය යුතු ය
3. කාලය මාස 06 යි පළමු මාසයේ සිට පරීක්ෂා කෙරේ
4. බීජ හා උපදෙස් රජය මගින් ලබා දෙයි
5. වගා බිමේ කාබනික පොහොර නිෂ්පාදනයට විශේෂ ලකුණු ලැබේ
6. තෑගි පිළිබඳ විස්තර
7. කෘෂි පර්යේෂණ නිලධාරීගේ දුරකථන අංකය

ලකුණු විග්‍රහය :-

| | |
|---|---|
| ආකෘතිය | ලකුණු 05 යි. |
| අන්තර්ගතය | ලකුණු 07 යි. |
| ශිල්පීය දක්ෂතා | ලකුණු 03 යි. |

<u>නැතහොත්</u>

අන්තර්ගතය :-
1. සිසුන් 700 ක් පමණ ඉගෙනුම ලබන පාසලක්
2. දරුවන්ගේ පවුල් පරිසරය අයහපත්
3. ආදරය, රැකවරණය හා පෝෂණය නොලැබෙන දරුවන්
4. ප්‍රධාන හේතුව පියවරුන්ගේ බීමත්කම
5. දරුවන් සම්බන්ධ යුතුකම් වගකීම්වල නීතිමය තත්ත්වය පිළිබඳ දෙමාපිය දැනුවත් කිරීම
6. සුදුසු නිලධාරියෙකු ඉල්ලා සිටීම
7. දිනය, වේලාව හා ස්ථානය

ලකුණු විග්‍රහය :-

| | |
|---|---|
| ආකෘතිය | ලකුණු 05 යි. |
| අන්තර්ගතය | ලකුණු 07 යි. |
| ශිල්පීය දක්ෂතා | ලකුණු 03 යි. |

## III කොටස

| | | | | |
|---|---|---|---|---|
| 01 (i) | (අ) | මහෞෂධ පඬිතුමා | (ආ) | අෂ්ඨවංක මාණික්‍යය / මිණි රුවන |
| (ii) | (අ) | ප්‍රබුද්ධ | (ආ) | නොම්යෙමි / සක්වාලිහිනි |
| (iii) | (අ) | තිසර සන්දේශය | (ආ) | මයුර සන්දේශය |
| (iv) | (අ) | මැටිල්ඩා | (ආ) | දියමන්ති මාලය |
| (v) | (අ) | කුසජාතක කාව්‍ය | (ආ) | අලගියවන්න මුකවෙටි |
| (vi) | (අ) | වැසි සමේ රෑ ඇඳේ සිහිනයක් වී ඉන්න | (ආ) | ඔබ එන්න - ඉතින් මගෙ හෙට දවස මට දෙන්න |
| (vii) | (අ) | අපට වැසිකිළියක් කෙටි කතාවේ කථකයාගේ පියා | | |
| | (ආ) | මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට | | |
| (viii) | (අ) | සිංහල ගද්‍ය පද්‍ය නිර්මාණයන්හි රිද්ම ලක්ෂණ | (ආ) | තුංමංහංදිය |
| (ix) | (අ) | රත්න ශ්‍රී විජේසිංහ | (ආ) | පුනරුප්පත්තිය මළු තවත් කෙටි කතා |
| (x) | (අ) | දඹදෙණි යුගය | (ආ) | කෝට්ටේ යුගය (ලකුණු 2 × 10 = 20) |

02 (i) (අ) • වැලි තෙලෙන - වැලිතලාවල / වැලිතලාමත • මන් තොසින් - සිතේ සතුටින්

(ආ) බොහෝ හීන් ගෙන්දගස්වල සෙවණැල්ලෙන් යුක්ත වූ වැලිතලාවල ඒ ඒ තැන නැවතී සියුමැලි නිසා විවේක ගෙන රන්වන් වී කරල් ගෙන එන ගිරවුන්ගෙන් ගමන් මාර්ගය ගැන නියම තොරතුරු දැනගෙන සතුටින් යන්න.

(ii) (අ) මැටිල්ඩා හා ෆොරෙස්ටියර් මහත්මිය

(ආ) ෂාං සෙලිසේහි ඇවිදීමට ගිය ලොයිසල් මහත්මියට අවුරුදු දහයකට පසුව ෆොරෙස්ටියර් මහත්මිය හමු වූ අවස්ථාවේ දියමන්ති මාලය ගැන තතු පවසන අවස්ථාව

(iii) (අ) බුදුරජාණන් වහන්සේ උග්ගසේන සිටු පුත්‍රයාට

(ආ) ක්‍රීඩා, නාට්‍යයන්ට ආශාව ඇති කරගෙන පසුගිය දවස්වල තිබූ පඤ්චස්කන්ධයෙහි ආශාව / ආදරය අත් හරින්න. මතුයම් දවසක / අනාගතයේ ඒ පඤ්චස්කන්ධය කෙරෙහි ඇති ආශාවන් අත්හරින්න.

(iv) (අ) සිංහයා

(ආ) සුප්පාදේවිය, සිංහබාහු, සිංහසීවලී

(v) (අ) • මිහ'ඹ - මහී කාන්තාව / මිහිකත • කිරඹ - කිරිවතුර

(ආ) • කැරගල වෙහෙර / කැරගල පද්මාවතී පිරිවෙන් විහාරය • හංසයාට (ල. 4 ×5= 20)

03 (i) • කථකයාගේ මල්ලී කතාවට සම්බන්ධවන අවස්ථාව

- සෞඛ්‍ය පරීක්ෂකගේ පැමිණීම.
"අය්යෙ, අය්යෙ, පොලිස්කාරයෙක්"
"කවුද මේ ගෙදර ගෘහ මූලිකයා"?
"කවුද මේ ගෙදර ලොක්කා"
"මම" තාත්තා බයාදු ලෙස පිළිතුරු දිනි.

• කුරහන් ඇඹරීම සඳහා මල්ලී සම්බන්ධ කර ගැනීම.
"හෙට උදේට කුරහන් රොටී ටිකක් හදන්න කුරහන් ටික අඹරගන්න උදව් වෙනවද මල්ලියෙ,"
"මේ උදේම කුරහන් අඹරන්න පුළුවනැ' දවල් වෙලා එන්නම්"

• වැසිකිළි භාවිතයට අනුගත වූ අයුරු
- ★ කැළෑ රොදට වදිද්දි වරක් දෙවරක්ම පයට දැනුණු පිළිකුළ ස්පර්ශය මතක් වන විටත් හිරිකිතයක් ඇති කරලයි.
- ★ අලුත් භාණ්ඩයක් භාවිතයට ගැනීමට කෙනෙකු තුළ ඇති වන ආශාවට සමාන ආශාවන්ද මා තුළ ඇත.
- ★ වැසිකිළිය ප්‍රයෝජනයට ගත්තත් ජලය සඳහා එදිනද මම ඇළ පාට ගියෙමි.

ඉහත සඳහන් නිදසුන් හෝ ඊට අදාළ වෙනත් නිදසුන්.

<u>නැතහොත්</u>

(i) ▪ ගත වෙහෙසා කටයුතු කිරීම සුදුසු බව.
- ★ මාගත වෙහෙසම ආදරයෙන් දිය
උල්පත පාදන පුංචි පුතුන්...... යන පද්‍යය
- ★ අඩසඳ මෝරන මැදියම් අහසින්
බිළිඳු හඬට කිරි දියර ගලයි...... යන පද්‍යය

▪ කවියා යොදා ඇති කාව්‍යෝපක්‍රම
- ★ දෑතේ කරගැට සිඹසනසන්නට
..........................
දහදිය මුතු ඇට මල් වරුසා වී - රූපක
- ★ අඩසඳ මෝරන මැදියම් අහසින්
..........................

04. (i) මැටිල්ඩා ඉහළ සමාජයේ ඇවතුම් පැවතුම්වලට කැමැත්තක් දැක්වූ අයුරු
- • තමා ඉපදී ඇත්තේ සියලුම සැප සම්පත් හා සුඛවිහරණ ආස්වාදනය කිරීමට යන හැඟීම නිසා අද නිරන්තරයෙන් දුක් වේදනාවලට භාජනය වූවාය.
- • පෙරදිග මහාර්ඝ තිරරෙදිවලින් අලංකාර කරන ලද උස්ලෝකඩ පහන් රුක්වලින් ඒකාලෝක කරන ලද ගිනි උඳුනේ.

(ii) සිය සැමියාට දුර්භාග්‍ය උදා වූ අයුරු
- ★ "මොකද මේ ඔයාට වෙලා තියෙන්නේ?"

නැතහොත්

(i) අමාවතුර ග්‍රන්ථයේ භාෂා ශෛලය

සංක්ෂිප්ත ගද්‍ය ශෛලිය -

- ★ නොවියත් හුදී ජනයා සඳහා........

කෙටි වැකි -

- ★ වත්සපන, කී, කි දෙයක් වහා සපයයි.

සරළ භාෂා රීතිය

- ★ සොර ක්ලාන්ත විය, මියෙහි කෙළ සිඳී ගියෙ ශරීරයෙන් ස්වේද බස්සී.

සංවාදශීලී බස් වහර

- ★ "මහරජ, තොපගේ රට අගුල් මල් නම් සොරුන් ක, දරුණෑ, ලෙහෙමුඩු අත් ඇත්තේයැ"

ඇ කාර භාවිතය

- ★ බඩැ බඳ සළුව ඇරැ ගෙනැ මහතෙරුන් පාමුල තැබීයැ.

(ලකුණු 3 + 7 = 10)

05. අවට රැස්වූවන් වශී වූ ආකාරය :
- ★ කන්කලු වෙණ නද ඇසුමෙහි ලොබිනේ......
- ★ නිති නිරිඳුගෙ රැකවලෙහි නියුන්තෝ........
- ★ මනමත් කරවන ලද මුළු දෙරණා...........
- ★ පියසන් නොව බිඟු දැල් රැදි කොපුලී..........
- ★ යොදා සවන් වෙණ නද රස සුලබව...........

06. චූලනී බ්‍රහ්ම දත්ත රජු හා සේනාව පීඩාවට පත් කළ අයුරු
- බමුණා මහෞෂධ පඬිතුමා ඉදිරිපිට බිමට නැමී මැණික ගන්නා අවස්ථාව.
  "නැගී සිටුව ආචාරනී, නැගී සිටුව මම බාලයෙමි."
- "කොළ පවිටු දුෂ්ට අධර්මිෂ්ඨ වූ නිකෘෂ්ඨ අනාචාර ස්වරූප ඇති අවලස්සන බමුණු මහල්ල."
- ඉතා අලජ්ජී වූ කේවට්ටයා අසු නැඟී කටින් ලේ දම දමා නළලේ ලේ පිස පිස දිවන්නේය.
- ජඩය මෑත නොදොඩා ගොයින් තාගේ පණ නොනසා යන අතෙක නැගී යා' යි.

07. ● වස්සානය නිසා පරිසරයේ සිදුවන සුන්දරත්වය,
- ඔයදැල දොඩමලුය, සුවඳ බැරුවා ඉන්ට.....
- කෙකටියා පදුර සුදුමල් පොකුර වඩාගෙන
- කුඹුක් අතු වතුර අත ගගා නැමීලා දියට
- හුළංදා ඔය කිමිද මල්වරව ඉල්මහට.
- රමණීය වන ගැබෙහි මොනරුන්ට පිල් වියන

(ලකුණු 4 + 11 = 15)